# ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරයේ ප්‍රමුඛ ආයතනය සමඟ ඔබේ හැකියාවන් බෙදාගන්න

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යනු සංචාරක ව්‍යාපාරය සහ ඒ ආශ්‍රිත කර්මාන්ත සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, නියාමනය කිරීම සහ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා පැවරී ඇති රජයේ අධිකාරිය වේ. සංචාරක ක්ෂේත්‍රයේ අනාගතය සඳහා ජාතික ආර්ථිකයට තීරණාත්මක දායකත්වයක් සපයන්නෙකු ලෙස හඳුනාගෙන ඇත. මෙම අංශය ඉහළම සෘජු විදේශ ආයෝජන සහ ඉහළ මට්ටමේ ආයෝජක ව්‍යාපෘති කිහිපයක් ද රට වෙත ආකර්ෂණය කරයි.

අධිකාරියේ පවතින පහත දැක්වෙන පුරප්පාඩු සඳහා සුදුසුකම් ලත් අය වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අංකය | තනතුර | සේවා කාණ්ඩය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | අධ්‍යක්ෂ / සංචාරක සැලසුම් සහ සංවර්ධන | HM 1-1 | 01 |
| 02. | සහකාර අධ්‍යක්ෂ / මෘදුකාංග ඉංජිනේරු | MM 1-2 | 01 |
| 03. | කණිෂ්ඨ කළමනාකාර / මානව සම්පත් | JM 1-2 | 01 |
| 04. | බහු තාක්ෂණ ශිල්පී | PL 3 | 03 |
| 05. | පොම්ප ක්‍රියාකරු | PL 2 | 02 |

උනන්දුවක් දක්වන අයදුම්කරුවන් පහත මාර්ගෝපදේශ පිළිපැදිය යුතුය:

• අවශ්‍ය සුදුසුකම් ඇතුළත් විස්තරාත්මක රැකියා දැන්වීම SLTDA වෙබ් අඩවියේ “Careers” ප්‍රවේශය යටතේ ලබාගත හැක – http://www.sltda.gov.lk/en/careers.

• තනතුරට අදාල අයදුම්පත්‍රය ඉහත වෙබ් පිටුවෙන් බාගත කර අපේක්ෂා කරන තනතුරට අදාලව පුරවා සම්පූර්ණ කල යුතුය.

• සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුය.

• තනතුරෙහි කාර්යයන් කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට හොඳ ශාරීරික හා මානසික මට්ටමක සිටිය යුතු අතර, රටේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

• තම ජීව දත්ත තොරතුරු සමඟ සම්පූර්ණ කරන ලද අයදුම්පත අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්දට අදාල සහතික කළ පිටපත් හා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ ඇමතුම් තොරතුරු සමඟ 2026.07.03 වන දින හෝ ඊට පෙර පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපැල මගින් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කල යුතුය.

සභාපති,
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය,
නො: 80, ගාලු පාර,
කොළඹ 03

• රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහා ඉදිරිපත් කල යුතුය.

ඉහත අවශ්‍යතා සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අවම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය අධිකාරී කළමනාකාරීත්වය සතුය. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**සේවක අර්ථ සාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායකත්වය**

තෝරාපත්වන අයදුම්කරුවන් තම වැටුපෙන් 10%ක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායක විය යුතුය. අධිකාරිය විසින් සේවක අර්ථ සාධක අරමුදලට (EPF) 15% ක් සහ සේවක භාරකාර අරමුදලට (ETF) 3%ක් දායක වනු ඇත.

**වැටුප**

2025 අප්‍රේල් 01 සිට ක්‍රියාත්මක වන **කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ 01/2025** අනුව වැටුප් ගෙවනු ලැබේ.

පුරප්පාඩු පිරවීම හා බඳවාගැනීම් සම්බන්ධයෙන් අධිකාරිය විසින් ගනු ලබන තීරණ අවසන් තීරණය වේ.

**සභාපති,**
**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය,**
**අංක 80, ගාලු පාර,**
**කොළඹ 03.**

**ප්‍රකාශිත දිනය 2026.06.19**

**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**

**ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරයේ ප්‍රමුඛ ආයතනය සමඟ**
**ඔබේ හැකියාවන් බෙදාගන්න**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යනු සංචාරක ව්‍යාපාරය සහ ඒ ආශ්‍රිත කර්මාන්ත සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, නියාමනය කිරීම සහ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා පැවරී ඇති රජයේ අධිකාරිය වේ. සංචාරක ක්ෂේත්‍රයේ අනාගතය සඳහා ජාතික ආර්ථිකයට තීරණාත්මක දායකත්වයක් සපයන්නෙකු ලෙස හඳුනාගෙන ඇත. මෙම ක්ෂේත්‍රය ඉහළම සෘජු විදේශ ආයෝජන සහ ඉහළ මට්ටමේ ආයෝජක ව්‍යාපෘති කිහිපයක් ද රට වෙත ආකර්ෂණය කරයි.

අධිකාරියේ පවතින පහත දැක්වෙන පුරප්පාඩු සඳහා සුදුසුකම් ලත් අය වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අංකය | තනතුර | සේවා කාණ්ඩය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | අධ්‍යක්ෂ / සංචාරක සැලසුම් සහ සංවර්ධන | HM 1-1 | 01 |
| 02. | සහකාර අධ්‍යක්ෂ / මෘදුකාංග ඉංජිනේරු | MM 1-2 | 01 |
| 03. | කණිෂ්ඨ කළමනාකාර / මානව සම්පත් | JM 1-2 | 01 |
| 04. | බහු තාක්ෂණ ශිල්පී | PL 3 | 03 |
| 05. | පොම්ප ක්‍රියාකරු | PL 2 | 02 |

## 1. අධ්‍යක්ෂ/ සංචාරක සැලසුම් සහ සංවර්ධන (පුරප්පාඩු 01)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

**අ.**
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සංචාරක කළමනාකරණය, සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය, සංචාරක සැලසුම්, සංචාරක සංවර්ධන, ව්‍යාපාර කළමනාකරණ, ව්‍යාපාර පරිපාලනය, ආර්ථික විද්‍යාව, ඉංජිනේරු සම්බන්ධ උපාධියක් ලබා තිබීම.

සමඟ

උක්ත සඳහන් තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නාවූ, පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම.

**ආ.**
තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ, පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සුපරා තිබීම.

2. කළමනාකරණ සේවා (MM 1-2) ගණයෙහි 1 වන ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

**වයස**

අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**වැටුප**

HM 1-1 2025
රු. 140,640/- - 15x රු. 4,100/- - රු. 202,140/- + ජීවන වියදම් දීමනාව

**ප්‍රතිලාභ**

- සේවකයා සහ පවුල ආවරණය වන කර්ශනීය වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක්
- ඉන්ධන සහ ප්‍රවාහන දීමනාව
- දුරකථන දීමනාව
- වෘත්තීය දීමනාව
- ණය පහසුකම්

## 2. සහකාර අධ්‍යක්ෂ/ මෘදුකාංග ඉංජිනේරු (පුරප්පාඩු 01)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

(අ).
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්ෂණ/ පරිගණක විද්‍යාව/ මෘදුකාංග නිර්මාණකරණය/ මෘදුකාංග ඉංජිනේරු සම්බන්ධ විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

හෝ

(ආ).
උක්ත විෂය ක්ෂේත්‍රයන්ට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික හෝ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

උපාධිය/ ප්‍රවීණතා සහතිකය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ "කණිෂ්ඨ කළමනාකාර" (JM 1-2) II ශ්‍රේණියේ සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස**

අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**වැටුප**

MM 1-2 2025 රු. 94,170/- 10 x රු. 2,480/- 15 x රු. 3,450/- රු. 170,720/- + ජීවන වියදම් දීමනාව

**ප්‍රතිලාභ**

- සේවකයා සහ පවුල ආවරණය වන ආකර්ශණීය වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක්
- වෘත්තීය දියුණුව සඳහා පුහුණුව
- ප්‍රවාහන දීමනා
- සන්නිවේදන දීමනා
- වෘත්තීය දීමනා
- ණය පහසුකම්

## 3. කණිෂ්ඨ කළමනාකාර/ මානව සම්පත් – (පුරප්පාඩු 01)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත්/ රාජ්‍ය පරිපාලන/ ව්‍යාපාර කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය සම්බන්ධ විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

හෝ

2. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ තාක්ෂණ නොවන සේවා ගණයෙහි කළමනාකරණ සහකාර (MA 1-2) II ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**වැටුප**

JM 1-2 2025 රු. 74,010/- 10 x රු. 1,360/- 18 x රු.2,040/- රු. 124,330/- + ජීවන වියදම් දීමනාව

**ප්‍රතිලාභ**

- සේවකයා සහ පවුල ආවරණය වන ආකර්ශණීය වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක්
- වෘත්තීය දියුණුව සඳහා පුහුණුව
- ප්‍රවාහන දීමනා
- සන්නිවේදන දීමනා
- ණය පහසුකම්

## 4. බහු තාක්ෂණ ශිල්පී – (පුරප්පාඩු 03)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

**ශිල්පීය නිපුණතා**

එක් එක් තනතුරෙහි කාර්යභාරයට අදාලව තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) සිව්වැනි (4) වැනි මට්ටම නොඅඩු මට්ටමක මෝටර් කාර්මික/ විදුලි කාර්මික/ ජල කාර්මික/ වායුසමන/ පෙදරේරු/ වඩු කාර්මික සම්බන්ධ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

අදාල ක්ෂේත්‍රයේ වසර පහ (5) ක පලපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/ වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූලවන ජාතික වාත්තීය කුසලතා (NVQ) හතර (4) වැනි මට්ටමට නොඅඩු මට්ටමක වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත්ව තිබීම.

හෝ

එක් එක් තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හී (NVQ) හතර (4) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වයස**

අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

**වැටුප් පරිමාණය**

PL 3 2025
රු.43,280/- 10 x රු.490/- 10 x රු.540/- 10 x රු.590/- 12 x රු.630/- රු.67,040/- + ජීවන වියදම් දීමනාව

**ප්‍රතිලාභ**

- සේවකයා සහ පවුල ආවරණය වන ආකර්ශණීය වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක්
- වෘත්තීය දියුණුව සඳහා පුහුණුව
- ප්‍රවාහන දීමනා
- ණය පහසුකම්

## 5. පොම්ප ක්‍රියාකරු (පුරප්පාඩු 02)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවය (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක මෝටර් කාර්මික/ ජල කාර්මික සම්බන්ධ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

අදාල ක්ෂේත්‍රයෙහි වසර පහක (05) පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/ වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යයභාරයට අනුකූල වන වෘත්තීය පරීක්ෂණයක (Trade Test) දී තහවුරු කෙරෙන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවෙනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

තනතුරෙහි කාර්යභාරයට අදාලව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවෙනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වයස**

අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප**

PL 2 රු. 42,300/- 10 x රු.490/- 10 x රු.540/- 10 x රු.590/- 12 x රු.630/- රු.66,060/- + ජීවන වියදම් දීමනාව

**ප්‍රතිලාභ**

- සේවකයා සහ පවුල ආවරණය වන ආකර්ශණීය වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක්
- වෘත්තීය දියුණුව සඳහා පුහුණුව
- ප්‍රවාහන දීමනා
- ණය පහසුකම්

**සභාපති,**
**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය,**
**අංක 80, ගාලු පාර,**
**කොළඹ 03.**

**ප්‍රකාශිත දිනය : 2026.06.19**